# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනත

[සහතිකය සටහන් කළේ 1987 පෙබරවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 පෙබරවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 2·70 යි. තැපැල් ගාස්තුව : රු. 2.30 යි

# 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනත

[සහතිකය සටහන් කළේ 1987 පෙබරවාරි මස 09 වන දින.]

එල්. ඩී.—ඕ. 2/82

## ව්‍යාපාර නාම පිළිබඳ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

1. මෙම පනත 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍යතා

*ව්‍යාපාර ආයතන සහ තැනැත්තන් ලියාපදිංචි කළ යුතු බව.*

2. (අ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ ද පුද්ගලයන් වන සියළුම හවුල්කරුවන්ගේ සත්‍ය සම්පූර්ණ නාමයන්ගෙන් සමන්විත නොවන්නා වූ සහ යම් එකතු කිරීමක් නොමැතිව, සංස්ථාවන් වූ සියලුම හවුල්කරුවන්ගේ සංස්ථා නාමයන්ගෙන් සමන්විත නොවන්නා වූ ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ ද සෑම ව්‍යාපාර ආයතනයක් ම ;

(ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ සහ එකතු කිරීමක් නොමැතිව, තම සත්‍ය සම්පූර්ණ නාමයන්ගෙන් සමන්විත නොවන්නා වූ ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ සෑම පුද්ගලයෙක් ම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ ද කාන්තාවක් සම්බන්ධයෙන් වන විටෙක, විවාහයේ ප්‍රතිඵලයක් වශයෙන් නාමය වෙනස් කරන ලද අවස්ථාවක හැර, මේ පනත සම්මත කිරීමට පෙර හෝ පසුව, තම නාමය වෙනස් කළාවූ ද සෑම පුද්ගලයෙක් ම හෝ ව්‍යාපාර ආයතනයක් නම් නාමය වෙනස් කළ සාමාජිකයකුගෙන් සමන්විත සෑම ව්‍යාපාර ආයතනයක්ම ; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ සහ යම් එකතු කිරීමක් නොමැතිව සිය සත්‍ය සංස්ථා නාමයෙන් සමන්විත නොවන ව්‍යාපාර නාමයකින් ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ සෑම සංස්ථාවක් ද

2—ඒ 09538—7,725 (86/05)

මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනතින් විධාන කර ඇති අන්දමට ලියාපදිංචි කරනු ලැබිය යුතු ය ;

එසේ වුව ද

(i) ව්‍යාපාරය කරගෙන යනු ලබන්නේ එකී සැලින් අයිතිකරුට අනුප්‍රාප්තික වශයෙන් බව හුදෙක්ම ඒ එකතු කිරීමෙන් පෙන්නුම් කරන අවස්ථාවක, ඒ එකතු කිරීම නිසාම පමණක් ලියාපදිංචි කරනු ලැබීම අවශ්‍ය නොවිය යුතුය ; තව ද

(ii) වස්තුභංගත්වය බූදලයක පැවරුම්ලාභියකු විසින් හෝ යම් අධිකරණයක් විසින් පත් කරනු ලැබූ ලැබුම්කරුවකු හෝ කළමනාකරුවකු හෝ භාරකරුවකු විසින් ව්‍යාපාරය එසේ කරගෙන යනු ලබන අවස්ථාවක, ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවිය යුතු ය ; තව ද

(iii) තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් කරනු ලබන දේපළ මිලට ගැනීමක් හෝ වෙනත් අත්කර ගැනීමක් එය විකිණීමෙන් උද්ගත වන්නා වූ යම් ලාභ අයිතිකරුවන් අතර බෙදනු ලැබුවත්, නොලැබුවත් එනයින්ම ව්‍යාපාරයක් කරගෙන යනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

විදේශීය ප්‍රධානයකු හෝ විදේශීය සමූහ ව්‍යාපාරයක් වෙනුවෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක්.

3. (1) විදේශීය ප්‍රධානයකුගේ ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු සඳහා ව්‍යාපාර නාමයකින් හෝ අන්‍යාකාරයෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකාව තුළ වූ යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 10 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ නිදහස් කිරීමේ නියමයක් ලබාගෙන මේ පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, 5 වන වගන්තිය යටතේ නියම කර ඇති ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ විස්තරවලට අතිරේකව, ඒ එක් එක් විදේශීය ප්‍රධානයා සම්බන්ධයෙන් පහත දැක්වෙන විස්තර ද සපයනු ලැබිය යුතු ය :—

(අ) විදේශීය ප්‍රධානයාගේ ව්‍යාපාර නාමය සහ ලිපිනය සහ ව්‍යාපාරයේ ස්වභාවය ; සහ

(ආ) ඒ විදේශීය ප්‍රධානයා සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා ක්‍රියා කිරීම ආරම්භ කළ දිනය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ව්‍යාපාරය මුළුමනින්ම හෝ ප්‍රධාන වශයෙන් විදේශීය ප්‍රධානයකු වෙනුවෙන් හෝ විදේශීය සමූහ ව්‍යාපාරයක් වෙනුවෙන් ක්‍රියා කිරීමෙන් සමන්විත වන අවස්ථාවක, එකී ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා සාමාන්‍යයෙන් ව්‍යාපාරික

කටයුතු කරන්නේ යම් විදේශීය ප්‍රධානයකු හෝ විදේශීය සමූහ ව්‍යාපාරයේ යම් සාමාජිකයකු සඳහා ද, ඒ විදේශීය ප්‍රධානයා හෝ විදේශීය සමූහ ව්‍යාපාරයේ සාමාජිකයා සම්බන්ධයෙන්, (1) වන උපවගන්තිය මගින් නියම කර ඇති විස්තරවලට අතිරේක ව, පහත දැක්වෙන විස්තර ද සපයනු ලැබිය යුතු ය :—

(අ) කවර හෝ ස්ථානයක පිහිටියා වූ ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම ;

(ආ) ව්‍යාපාරය ආරම්භ කළ දිනය ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර ස්ථානයක් ඇත්නම්, ඒ ස්ථානය ;

(ඈ) අයිතිකරුවකු හෝ හවුල්කරුවකු වන්නා වූ යම් පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට—

(i) දැනට භාවිතා කරන සම්පූර්ණ නාම ;

(ii) ජාතිය ; සහ

(iii) සාමාන්‍ය පදිංචිය ;

(ඉ) අයිතිකරුවකු හෝ හවුල්කරුවකු වන්නා වූ යම් සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට—

(i) සංස්ථා නාමය ;

(ii) ඒ සංස්ථාව සංස්ථාගත කරන ලද්දේ යම් නීතියක් යටතේ ද, ඒ නීතිය ; සහ

(iii) ඒ සංස්ථාවේ ලියාපදිංචි කළ ප්‍රධාන කාර්යාලය.

(3) විදේශීය ප්‍රධානයකුට හෝ විදේශීය සමූහ ව්‍යාපාරයක සාමාජිකයකුට අදාළව, නිවේදනයේ සඳහන් කරනු ලබන යම් අතිරේක විස්තර ඒ නිවේදනයේ නියම කර ඇති කාලය ඇතුළත සපයන ලෙස ශ්‍රී ලංකාවේ ව්‍යාපාරය කරගෙන යන්නා වූ මේ වගන්තියේ සඳහන් යම් ව්‍යාපාර ආයතනයකට හෝ තැනැත්තකුට, රෙජිස්ට්‍රාර්වරයා විසින් දන්වනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියෙහි—

"විදේශීය ප්‍රධානයා" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කරගෙන යන්නා වූ ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු අදහස් වේ ;

"විදේශීය සමූහ ව්‍යාපාරය" යන්නෙන් විදේශීය සංස්ථාවකින් සහ එහි පාලිත සමාගම්වලින් එකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන්නා වූ හෝ විදේශීය සංස්ථාවක පාලිත සමාගම් අතුරින් යම් පාලිත සමාගම් දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන්නාවූ විදේශීය ප්‍රධානයන් සමූහයක් අදහස් වේ ;

පුරවැසියකු නොවන පුද්ගලයකු විසින් සැපයිය යුතු විස්තර.

4. (1) ව්‍යාපාර නාමයක් යටතේ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් කර ගෙන යාමට අදහස් කරන, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් පුද්ගලයකු විසින් හෝ ස්වකීය හවුල්කරුවන්ගෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන එක් හවුල්කරුවකු සිටින ව්‍යාපාර ආයතනයක් විසින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් සංස්ථාවක් විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ නිදහස් කිරීමේ විධානයක් ලබා ගැනීමෙන් පසු, 5 වන වගන්තිය යටතේ සැපයීමට නියම කර ඇති විස්තර සැපයිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පුද්ගලයාගේ හෝ සංස්ථාවේ ව්‍යාපාරය, ඒ පුද්ගලයාගේ, ව්‍යාපාර ආයතනයේ හෝ සංස්ථාවේ නාමයෙන්, ශ්‍රී ලංකා පුරවැසියකු වන්නා වූ සහ ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින්නා වූ තැනැත්තකු විසින් කරගෙන යා යුතු අතර ඔහු දේශීය කළමනාකරු ලෙස සලකනු ලැබිය යුතු ය; මේ පනත යටතේ ඒ පුද්ගලයා, ව්‍යාපාර ආයතනය හෝ සංස්ථාව විසින් ඉටු කිරීමට බැඳී සිටින සියලු බැඳීම් ඉටුකිරීම සම්බන්ධයෙන් ඒ දේශීය කළමනාකරු විසින් පුද්ගලිකව ම වගකිව යුතු ය.

ලියාපදිංචි කිරීමේ විස්තර.

5. (1) මේ පනත යටතේ ලියාපදිංචි කිරීමට නියමිත සෑම ව්‍යාපාර ආයතනයක් ම හෝ තැනැත්තකු ම විසින්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ යම් කොටසක ද, එම කොටසෙහි පිහිටි රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලය වෙත, තැපැලෙන් එවීමෙන් හෝ ගෙනවිත් භාරදීමෙන් පහත දක්වෙන විස්තර ඇතුළත්, නියමිත ආකෘතියෙහි වූ ලිඛිත ප්‍රකාශයක් සපයනු ලැබිය යුතු ය:—

(අ) ව්‍යාපාරය කරගෙන යන්නේ යම් ව්‍යාපාර නාමයක් යටතේ ද, ඒ ව්‍යාපාර නාමය සහ එහි අක්ෂරානුකූල පරිවර්තනය ;

(ආ) ව්‍යාපාරයේ ස්වභාවය ;

(ඇ) ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ;

(ඈ) ව්‍යාපාරයේ කාර්ය සඳහා පවත්වාගෙන යනු ලබන යම් ශාඛා කාර්යාලයක, ගබඩාවක, ගුදමක හෝ බඩු ගබඩා සම්භයක ලිපිනය ;

(ඉ) ව්‍යාපාරය ආරම්භ කිරීමේ දිනය ;

(ඊ) පුද්ගලයකු විසින් හෝ (සීමිත හවුල්කරුවකු සංස්ථාවක් නොවන) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් විසින් හෝ ව්‍යාපාරය කරගෙන යන්නා වූ අවස්ථාවක, ඒ පුද්ගලයාගේ හෝ එවැනි සෑම හවුල්කරුවකුගේ ම පහත සඳහන් විස්තර :—

(i) දැනට භාවිත කරන සම්පූර්ණ නාමය ;

(ii) කලින් වූ යම් නාමයක් සම්පූර්ණයෙන් ;

(iii) උපන් දිනය ;

(iv) වත්මන් ජාතිය ; සහ ස්වකීය ජාතිය ප්‍රකාශ කර නොමැති විජාතිකයකු සම්බන්ධයෙන් වන විටෙක. ඔහු උපන් රට ;

(v) සාමාන්‍ය පදිංචි ස්ථානය ;

(vi) ඔහු අයිතිකරු වන හෝ හවුල්කරු වන වෙනත් සෑම ව්‍යාපාරයකම නාමය සහ එවැනි යම් ව්‍යාපාරයක ව්‍යාපාර නාමය සහ ලියාපදිංචි කළ අංකය ;

(vii) ඔහු අධ්‍යක්ෂවරයකු වන්නා වූ සෑම සංස්ථාවක ම නාමය ;

(viii) තමාගේ නමින් ම හෝ තම නාමිතයාගේ හෝ ස්වාමි පුරුෂයාගේ හෝ භාර්යාවගේ හෝ බාල වයස්කාර දරුවන්ගේ හෝ නමින්, ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයෙන් සියයට විසි පහකට වැඩි ප්‍රමාණයක් ඔහු විසින් දරන්නා වූ සෑම සංස්ථාවක ම නාමය ;

(ix) වෙනත් යම් ව්‍යාපාරික රැකියාවක ස්වභාවය ;

(ඇ) සංස්ථාවක් විසින් හෝ සියලුම හවුල්කරුවන් සංස්ථාවන් වන ව්‍යාපාර ආයතනයක් විසින් ව්‍යාපාරය කරගෙන යන්නා වූ අවස්ථාවක, ඒ එක් එක් සංස්ථාව පිළිබඳ පහත දැක්වෙන විස්තර :—

(i) සංස්ථා නාමය ;

(ii) සංස්ථාගත කරන ලද්දේ යම් නීතියක් යටතේ ද ? ඒ නීතිය ;

(iii) සංස්ථාගත කිරීම ලියාපදිංචි කිරීමේ අංකයක් තිබේ නම්, ඒ අංකය ;

(iv) ලියාපදිංචි කළ හෝ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය ;

(v) එහි එක් එක් අධ්‍යක්ෂවරයාගේ නම සහ ජාතිය ;

(vi) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් විස්තර ;

(ඈ) (i) හවුල්කරුවන් එක් අයකු හෝ ඊට වැඩි දෙනකු පුද්ගල යන් වන්නා වූ ව්‍යාපාර ආයතනයක් විසින් ව්‍යාපාරය කර ගෙන යනු ලබන අවස්ථාවක (ඊ) ඡේදයෙහි සඳහන් විස්තර ; සහ

(ii) එක් හවුල්කරුවකු හෝ හවුල්කරුවන් වැඩි ගණනක් සංස්ථාවක් හෝ සංස්ථා වන අවස්ථාවක, (ඇ) ඡේදයේ සඳහන් විස්තර ;

(එ) ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, හවුල් ව්‍යාපාර ගිවිසුමක් ලියවිල්ලකින් ඇති කරගෙන තිබේ ද යන වග;

(ඒ) වෙනත් යම් ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරය කරගෙන යන්නේ ද, ඒ වෙනත් ව්‍යාපාර නාමය;

(ඔ) ලියාපදිංචි කළ යුතු ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා ඇතුළත් වන වෙළෙඳ මණ්ඩලයක, සංගමයක හෝ වෙළෙඳ කොමිෂමක සාමාජිකත්වයට අදාළ වෙනත් යම් විස්තර.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ සපයන ලද ව්‍යාපාර නාමයේ අක්ෂරානුකූල පරිවර්තනයක් නොවන ව්‍යාපාර නාම එකක් හෝ ඊට වැඩි ගණනක් යටතේ ව්‍යාපාරයක් කරගෙන යන අවස්ථාවක, (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට ඒ එක් එක් ව්‍යාපාර නාමය සම්බන්ධයෙන් වෙනම ප්‍රකාශයක් සපයනු ලැබිය යුතු ය.

කලින් ලියාපදිංචි කර තිබුණද පනත ආරම්භ වීමෙන් පසු සැපයිය යුතු ප්‍රකාශය.

6. (1) නියමිත දිනයේ දී හෝ ඊට පෙරාතුව, ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් කරගෙන යන සෑම ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ම විසින්, නියමිත දිනයට පෙරාතුව ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා ලියාපදිංචි කරනු ලැබුව ද නොලැබුව ද, 4 වන වගන්තිය යටතේ නියම කර ඇති විස්තර පිළිබඳ ප්‍රකාශයක් පිටපත් දෙකකින් යුතුව සැපයිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විස්තර පිළිබඳ ප්‍රකාශය නියමිත දින සිට මාස හයක් ඇතුළත හෝ ඉල්ලීමක් මත රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉඩ දෙනු ලබන යම් වැඩිදුර කාල සීමාවක් ඇතුළත සපයනු ලැබිය යුතු අතර—

(අ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයා විසින් ද,

(ආ) සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, එහි අධ්‍යක්ෂවරයා හෝ ලේකම්වරයා විසින් ද,

(ඇ) ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වන විට, සියලුම හවුල්කරුවන් විසින් ද,

එය අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) නියමිත දිනයට පෙරාතුව ලියාපදිංචි කරන ලද යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක්, (2) වන උපවගන්තිය යටතේ සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත හෝ වැඩිදුර කාලසීමාව ඇතුළත (1) වන උපවගන්තිය යටතේ වූ විස්තර පිළිබඳ ප්‍රකාශයක් සැපයීමට අපොහොසත් වන අවස්ථාවක, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා ලියාපදිංචි කිරීම පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර

ඇරීමේ දින සිට ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද ඒ කාරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් සිය ලේඛනයේ සටහන් කළ යුතු ය.

(4) ලියාපදිංචි කිරීම අවලංගු කිරීමෙන් පසු යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක් ව්‍යාපාරය නොකඩවා කරගෙන යන අවස්ථාවක, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා වරදක් කරන අතර වරදකරු කරනු ලැබීමෙන් පසු, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඒ ආයතනය හෝ තැනැත්තා යටත් විය යුතු ය ; වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද නොකඩවා කරගෙන යන අවස්ථාවක, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා, වරදකරු කරනු ලැබීමෙන් පසු වරද නොකඩවා කරනු ලබන කාලය ඇතුළත වූ සෑම දිනයක් සඳහාම රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

අලුත් ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ ව්‍යාපාර නාමය වෙනස් කිරීම

7. (1) නියමිත දින හෝ ඉන් පසුව ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම ආරම්භ කරන හෝ ඒ දිනයෙන් පසු වෙනත් යම් හේතුවක් නිසා ලියාපදිංචි කරනු ලැබීමට යටත් වන සෑම ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ම විසින් 5 වන වගන්තිය යටතේ නියම කරන ලද විස්තර පිළිබඳ ප්‍රකාශයක් පිටපත් දෙකකින් යුක්තව සැපයිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සැපයීමට නියම කර ඇති විස්තර පිළිබඳ ප්‍රකාශය නියමිත ආකෘතියෙහි විය යුතු අතර, ඒ ආරම්භ කිරීමේ දින සිට දින තිහක් ඇතුළත හෝ ඒ වගකීම උද්ගත වූ දින හෝ ඉල්ලීමක් මත රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉඩ දෙනු ලබන වැඩිදුර කාලසීමාව ඇතුළත හෝ සපයනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ විස්තර පිළිබඳ ප්‍රකාශය—

(අ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් ද ;

(ආ) සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, එහි අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා විසින් ද ; තවද

(ඇ) ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වන විට, සියලුම හවුල්කරුවන් විසින් ද

අත්සන් කළ යුතු ය.

තහනම් කරන ලද ව්‍යාපාර නාම.

8. (1) (අ) (i) "ජනාධිපතිවරයා", "ජනාධිපති", "ජාතික", "රාජ්‍ය" හෝ "ශ්‍රී ලංකා" යන වචන හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව ජනාධිපතිවරයාගේ අනුග්‍රාහකත්වය නැතහොත් ආණ්ඩුවේ හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සමග යම් සම්බන්ධතාවක් හඟවන හෝ හැඟවීමට ඉඩ ඇති වචන ;

(ii) "නාගරික" හෝ "සංස්ථාගත" හෝ "සමාගම" යන වචන හෝ ඒවායේ සංක්ෂේපයක් නැතහොත් රෙජිස්ට්‍රාර්වර යාගේ මතය අනුව යම් මහනගර සභාවකට හෝ වෙනත් පළාත් පාලන ආයතනයකට හෝ පාර්ලිමේන්තු පනතකින් හෝ අන්‍ය කාරයකින් සංස්ථාගත කරන ලද යම් සමිතියකට හෝ මණ්ඩලයකට සම්බන්ධතා වක් හඟවන හෝ හැඟවීමට ඉඩ ඇති වචන; හෝ

(iii) "සංස්ථාව" හෝ "සමිතිය" යන වචන ඇතුළත් වන්නා වූ ව්‍යාපාර නාමයක් යටතේ;

**(ආ) ව්‍යාපාර නාමයක ස්වභාවය කරණකොටගෙන හෝ** ඒය ප්‍රයෝජනයට යොදවන ආකාරය කරණකොට ගෙන, ඒය සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි වන්නේ නම් සහ ඉන් යම් ජන කොට්ඨාසයක ආගමික හෝ වාර්ගික හැඟීම් රිදවීමට ඉඩ ඇති නම් හෝ ඒ නාමයෙන් හැඳින්වෙන වෙළෙඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය සම්බන්ධයෙන් වෙළෙඳ හෝ ව්‍යාපාරික කණ්ඩායම් හෝ මහජනතාව නොමඟ යැවීමට ඉඩ ඇති නම් ඒ ව්‍යාපාර නාමය යටතේ;

(ඇ) එවැනි ව්‍යාපාර නාමයක පරිවර්තනයක් වන්නා වූ ව්‍යාපාර නාමයක් යටතේ,

කිසිම ව්‍යාපාර ආයතනයක්, පුද්ගලයෙක් හෝ සංස්ථාවක් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරයක් පවත්වා ගෙන නොයා යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ලියාපදිංචි කරන ලද ව්‍යාපාර ආයතනයකට, පුද්ගලයකුට හෝ සංස්ථාවකට (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධාන අදාළ නොවන්නේ ය.

විස්තර ප්‍රකාශයේ වෙනස් කිරීම.

9. (1) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙකු සම්බන්ධයෙන් ලියාපදිංචි කරනු ලැබ ඇති යම් විස්තරවල වෙනස් කිරීමක් කරනු ලැබූ හෝ ඇති වූ කවර හෝ අවස්ථාවක, වෙනස් කිරීමක් කරන ලද සෑම විස්තරයක් ම සමග ඒ වෙනස් කිරීමේ ස්වභාවය සහ දිනය ද සඳහන් කරමින් 5 වන වගන්තිය යටතේ නියම කර ඇති විස්තර පිළිබඳව පිටපත් දෙකකින් යුක්ත වූ අළුත් ප්‍රකාශයක්, අවසන් වරට නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එහි සහතික කළ පිටපතක් ද සමග, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් සපයනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විස්තර පිළිබඳ ප්‍රකාශය නියමිත ආකෘතියෙහි විය යුතු අතර, ඒ වෙනස් කිරීමේ දින සිට දින තිහක් ඇතුළත සැපයිය යුතු ය: තව ද එය—

(අ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඔහු විසින් අත්සන් කළ යුතු ය;

(ආ) සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, එහි අධ්‍යක්ෂවරයා හෝ ලේකම්වරයා විසින් අත්සන් කළ යුතු ය; තව ද

(ඇ) ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වන විට, සියලුම හවුල් කරුවන් විසින් හෝ එක් හවුල්කරුවකු විසින් අත්සන් කළ යුතු ය. එක් හවුල්කරුවකු විසින් අත්සන් කරනු ලබන අවස්ථාවක, ඒ ප්‍රකාශය, ඒ හවුල්කරු විසින් සහතික කරන ලද දිවුරුම් පෙත්සමක් මඟින් සත්‍යෙක්ෂණය කළ යුතු ය.

(3) ව්‍යාපාර ආයතනයකට අළුත් හවුල්කරුවකු ඇතුල්වීම නිසා විස්තරවල යම් වෙනස් කිරීමක් ඇති වූ අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශය ඒ අළුත් හවුල්කරු ද ඇතුළුව, එක් එක් හවුල්කරු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) ව්‍යාපාර ආයතනයක යම් හවුල්කරුවකු සම්බන්ධයෙන් 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය හෝ (උ) ඡේදය යටතේ සපයන ලද විස්තරවල යම් වෙනස් කිරීමක් ඇති වූ අවස්ථාවක, ඒ ප්‍රකාශය ඒ හවුල්කරු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකු ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු ව සිටීම අවසන් වීම නිසා, විස්තරවල වෙනස් කිරීමක් ඇති වූ අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශය—

(අ) තවදුරටත් සිටින එක් එක් හවුල්කරු විසින් සහ හවුල්කරුවකුව සිටීම අවසන් වූ තැනැත්තා විසින් ; හෝ

(ආ) නියමිත අන්දමට දිවුරුම් පෙත්සමක් මඟින් එක් එක් අත්සන් තබන්නා විසින් ප්‍රකාශය සත්‍යෙක්ෂණය කිරීමට යටත්ව, තවදුරටත් සිටින එක් එක් හවුල්කරු විසින් ; නැතහොත්

(ඇ) හවුල්කරුවකුව සිටීම අවසන් වූ තැනැත්තා විසින් ප්‍රකාශය සත්‍යෙක්ෂණය කරනු ලබන්නේ නම්, ඒ තැනැත්තා විසින්

අත්සන් කළ යුතු ය.

(6) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක් සත්‍යෙක්ෂණය කරන්නා වූ ද, ප්‍රකාශක හැර වෙනත් යම් තැනැත්තකු හවුල්කරුවකු වන බව හෝ ඒ තැනැත්තා හවුල් කරුවකුව සිටීම අවසන් වූ බව සඳහන් කරන්නා වූ හෝ යම් තැනැත්තකු හවුල්කරුවකු වන බව හෝ හවුල්කරුවකුව සිටීම අවසන් වූ බව සඳහන් නොකරන්නා වූ ද යම් දිවුරුම් ප්‍රකාශයක්, හවුල්කරුවකු වශයෙන් ඒ වෙනත් තැනැත්තාගේ වගකීම හෝ වගකීමෙන් නිදහස් බව සම්බන්ධයෙන් ඒ වෙනත් තැනැත්තාට පක්ෂව හෝ විපක්ෂව ඉදිරිපත් කළ හැකි සාක්ෂ්‍ය නොවිය යුතු ය.

(7) සියලු හවුල්කරුවන් හවුල්කරුවන්ව සිටීම එකවිට ම අවසන්වීම හා ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව කරගෙන යාමට හැකි වන පරිදි අළුත් හවුල්කරුවන් ඇතුල් කරගැනීම මේ වගන්තියෙන් අදහස් කර ඇති විස්තරවල වෙනස් කිරීමට ඇතුළත් විය යුතු ය.

(8) දිවුරුම් ප්‍රකාශයකින් සත්‍යාපනය කිරීම අවශ්‍ය කරන සහ මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් ප්‍රකාශයක වූ යම් විස්තරයක් ලියාපදිංචි කිරීමට පෙර තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන අවස්ථාවක, විමර්ශනයට යටත්ව, ඒ ප්‍රකාශය ඔහු විසින් පිළිගනු ලැබිය හැකි අතර. ඒ කාර්යය සඳහා, රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් වැදගත් විස්තර පිළිබඳ අතිරේක සාධක වෙනත් යම් තැනැත්තකුගෙන් කැඳවිය හැකි අතර ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන විමර්ශනයක් ද පවත්වනු ලැබිය හැකි ය.

(9) නිසි පරීක්ෂණයකින් සහ එකී ප්‍රකාශයේ විස්තරවල අවශ්‍ය පරිදි නිවැරදි කිරීම් කළ පසු, ඒ ප්‍රකාශය නිවැරදි කර ඇත පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(10) (9) වන උපවගන්තිය යටතේ පවත්වන ලද පරීක්ෂණයකට අනතුරුව යම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කිරීමෙන් අතෘප්තියට පත් තැනැත්තා විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීම දැනුම්දුන් දින සිට දින තිහක් ඇතුළත, ඒ සම්බන්ධයෙන් උචිත දිසා අධිකරණයට අභියාචනයක් කළ හැකි අතර, ඒ අධිකරණය විසින් කරනු ලබන විධිමත් පරීක්ෂණයකින් පසුව, සුදුසුයයි එය අදහස් කරන ආඥාවක් කරනු ලැබිය හැකි ය.

**ලියාපදිංචි කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩ ව.ක.**

10. විස්තර ප්‍රකාශයක් හෝ විස්තරවල යම් වෙනස්කිරීමක් පිළිබඳ ප්‍රකාශයක් සපයන ලෙස මේ පනත යටතේ නියම කරනු ලැබ ඇති යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු විසින්, සාධාරණ හේතුවක් නොමැතිව, මේ පනතින් සඳහන් කර ඇති කාලය ඇතුළත සහ ආකාරයට සැපයීම පැහැර හරිනු ලැබුවහොත් එසේ පැහැර හැරීම කළ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම හෝ එසේ පැහැර හැරීම කළ තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසු පැහැර හැරීම අඛණ්ඩව පවත්වන සෑම දිනයක් සඳහා ම දිනකට රුපියල් එක් සියයක් බැගින් වූ අඛණ්ඩ දඩයකට ද ඔහු යටත් විය යුතු ය. තව ද ඒ හවුල්කරු හෝ තැනැත්තා පිළිබඳ ව නඩුව විභාග කරනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ දී ද ඒ අධිකරණය විසින්, අවශ්‍ය විටෙක, අවශ්‍ය කරන ලද විස්තර පිළිබඳ ප්‍රකාශයක්, ආඥාවෙහි සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත දී රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය.

**පැහැර හැරීම් කළ තැනැත්තන්ගේ අශක්තතාව.**

11. (1) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් විස්තර ප්‍රකාශයක් හෝ විස්තරවල යම් වෙනස්කිරීමක් පිළිබඳ ප්‍රකාශයක් සපයන ලෙස මේ පනතින් නියම කරනු ලැබ ඇති යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු විසින් එසේ කිරීම පැහැර හරින ලද අවස්ථාවක, පැහැර හැරීම කරනු ලැබ සිටින කාලය තුළ කවර හෝ වේලාවක දී ඒ පැහැර හරින්නා විසින් හෝ වෙනුවෙන් කර ඇති හෝ ඇතුළත් වී ඇති ඒ ව්‍යාපාරයට අදාළ යම් ගිවිසුමක් යටතේ හෝ ඉන් පැන නගින, ඒ පැහැර හරින්නාගේ අයිතිවාසිකම්, ව්‍යාපාරික නාමයෙන් හෝ අන්‍යාකාරයකින්. නඩුවක් මගින් හෝ වෙනත් නඩු කටයුතු මගින් හෝ බලාත්මක කරනු නොලැබිය යුතු ය :

එසේ වුව ද—

(අ) මේ වගන්තියෙන් පනවා ඇති අශක්‍යතාවට එරෙහිව සහනයක් ලබා ගැනීම සඳහා පැහැර හරින්නා විසින් අධිකරණය වෙත ඉල්ලුම්කර සිටිය හැකි අතර, පැහැර හැරීම අහම්බෙන් සිදු වූවක් හෝ ප්‍රමාද දෝෂයක් නිසා සිදු වූවක් හෝ වෙනත් සෑහෙන හේතුවක් නිසා සිදු වූවක් බවට අධිකරණය සෑහීමකට පත්වූයේ නම් හෝ වෙනත් කරුණු උඩ සහනය සැලසීම සාධාරණ සහ යුක්ති සහගත බවට අධිකරණය සෑහීමට පත්වූයේ නම්, අධිකරණය විසින් අන්‍යාකාර ආඥාවක් කරන්නේ නම් මිස ඉල්ලුම් කිරීමේ වියදම් පැහැර හරින්නා විසින් ගෙවීමේ කොන්දේසිය මත සහ අධිකරණය විසින් පනවනු ලබන වෙනත් යම් කොන්දේසි ඇතොත්, ඒ කොන්දේසි මත, පොදු වශයෙන් නැතහොත් යම් විශේෂ ගිවිසුම් සම්බන්ධයෙන් අධිකරණය විසින් ඒ සහනය සැලසිය හැකි ය ; එහෙත්, අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි අයුරු ඉල්ලුම් කිරීමේ දැන්වීම භාරදීම සහ පළකිරීම කරනු ලැබ ඇත්තේ නම් හැර, ඒ සහනය නොසැලසිය යුතු ය ; තව ද, මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරන ලද්දේ නම් තමා යම් ගිවිසුමකට ඇතුළත් නොවිය හැකිව තිබුණ බව ගිවිසුමට ඇතුළත් වූ යම් පාර්ශ්වයක් විසින් අධිකරණය සෑහීමට පත වන පරිදි ඔප්පු කරන ලද්දේ නම් ඒ ගිවිසුම සම්බන්ධයෙන් ද සහනය නොසැලසිය යුතු ය ;

(ආ) ඉහත සඳහන් ගිවිසුම සම්බන්ධයෙන් පැහැර හරින්නාට විරුද්ධව කටයුතු කිරීමට වෙනත් යම් පාර්ශ්වකරුවකු සතු අයිතිවාසිකම්වලට මෙහි සඳහන් කිසිවකින් හානියක් සිදු නොවිය යුතු ය ;

(ඇ) ඒ ගිවිසුම සම්බන්ධයෙන් වෙනත් යම් පාර්ශ්වකරුවකු සතු අයිතිවාසිකම් බලාත්මක කිරීම සඳහා පැහැර හරින්නාට විරුද්ධ ව ඒ පාර්ශ්වකරු විසින් යම් නඩුවක් හෝ නඩු කටයුතු ආරම්භ කරනු ලැබුවහොත්, ඒ ගිවිසුම සම්බන්ධයෙන් ඒ පාර්ශ්වකරුට විරුද්ධව පැහැර හරින්නාට තිබිය හැකි අයිතිවාසිකම්, ඒ නඩුවේ දී හෝ නඩු කටයුතු වල දී හරස් ඉල්ලීමක් මගින්, හිලව් කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් පැහැර හරින්නා විසින් බලගැන්වීම මෙහි සඳහන් කිසිවකින් වළක්වාලීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියෙහි "අධිකරණය" යන්නෙන්, ගිවිසුමක් බලාත්මක කිරීම සඳහා පැහැර හරින්නකු විසින් නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් ආරම්භ කරනු ලබන්නේ යම් අධිකරණයක දී ද ඒ අධිකරණය අදහස් වේ.

අසත්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් දණ්ඩන.

12. මේ පනත යටතේ ඉදිරිපත් කිරීමට නියම කර ඇති යම් ප්‍රකාශයක් අත්සන් කරන යම් තැනැත්තකුගේ දැනුම අනුව අසත්‍ය වන යම් වැදගත් විස්තරයක් ඒ ප්‍රකාශයේ අඩංගු වේ නම්, ලඝු නඩු විභාගයකින් ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට මාස

හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### පත් කිරීම්, ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය

රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම සහ ඔහුගේ කාර්ය.

**13.** (1) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා හෝ තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි පත් කිරීමක් කර නොමැති විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා හෝ තත්කාලයෙහි එලෙස ක්‍රියා කරන යම් තැනැත්තකු ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා විය යුතු අතර, මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු කාර්ය ඔහු විසින් ඉටු කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය පාලනය සහ අධීක්ෂණය, අමාත්‍යවරයාගේ විධානයට යටත්ව, ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා වෙත සතු වන්නේ ය.

අතිරේක රෙජිස්ට්‍රාර්වරයා සහ සහකාර රෙජිස්ට්‍රාර්වරු.

**14.** එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා කලින් කල—

(අ) (මෙහි මින් මතු අතිරේක රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් හඳුන්වනු ලබන) අතිරේක ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසු සහ යෝග්‍ය තැනැත්තකු ; සහ

(ආ) (මෙහි මින් මතු සහකාර රෙජිස්ට්‍රාර්වරයන් වශයෙන් හඳුන්වනු ලබන) සහකාර ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයන් ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයන් වශයෙන් ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අදහස් කරන, සුදුසු සහ යෝග්‍ය තැනැත්තන්

පත් කරනු ලැබිය හැකි ය.

(2) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය හැර, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා අතිරේක රෙජිස්ට්‍රාර්වරයකු පත් කර නොමැති විට, ඒ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා තම දිස්ත්‍රික්කය සඳහා අතිරේක ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා විය යුතු අතර, ඒ අනුව තිල නාම කරනු ලැබිය යුතු ය.

(3) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සහකාර රෙජිස්ට්‍රාර්වරයන් පත් කර නොමැති විට, සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයන් හෝ වැඩ බලන සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයන් කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සහකාර රෙජිස්ට්‍රාර්වරයන් විය යුතු ය.

(4) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය හැර, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් සහකාර රෙජිස්ට්‍රාර්වරයන් පත් කර නොමැති විට, ඉහතකී එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ කාර්යාල සහකාරවරු හෝ අතිරේක කාර්යාල සහකාරවරු ශ්‍රී ලංකාවේ ඒ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සහකාර රෙජිස්ට්‍රාර්වරයන් විය යුතු අතර, ඒ අනුව නිල නාම කරනු ලැබිය යුතු ය.

(5) මේ පනතින් හෝ ඒ යටතේ, රෙජිස්ට්‍රාර්වරයා වෙත පනවනු ලැබූ සහ හෝ පවරනු ලැබූ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය, රෙජිස්ට්‍රාර්වරයාගේ අධිකාරය හෝ පාලනය යටතේ, යම් අතිරේක රෙජිස්ට්‍රාර්වරයකු හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයකු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

රෙජිස්ට්‍රාර් කාර්යාලය පිහිටුවීම.

15. (1) (අ) කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත ප්‍රධාන ලියාපදිංචි කිරීමේ කාර්යාලය විය යුතු මේ පනතෙහි "රෙජිස්ට්‍රාර් කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන, ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාලයක් ; සහ

(ආ) සෙසු එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල

ගැසට් නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් පිහිටුවිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් කාර්යාලය පිහිටුවීම කර නොමැති විට, සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ දෙපාර්තමේන්තුව කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ලියාපදිංචි කිරීමේ කාර්යාලය මෙන්ම ප්‍රධාන ලියාපදිංචි කිරීමේ කාර්යාලය ද විය යුතු ය.

(3) දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල පිහිටුවීම කර නොමැති විට, (කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගේ කාර්යාලය හැර) ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්කවල දිසාපතිවරුන්ගේ කාර්යාල, ඒ පරිපාලන දිස්ත්‍රික්ක සඳහා ලියාපදිංචි කිරීමේ කාර්යාල විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා වෙත විස්තර සැපයීමේ කාර්ය.

16. (1) යම් තැනැත්තකු හෝ ඒ තැනැත්තා හවුල්කරුවකු වන ව්‍යාපාර ආයතනය මේ පනත යටතේ ලියාපදිංචි කළ යුතු ද නැද්ද යන්න හෝ ලියාපදිංචි කළ විස්තරවල වෙනසක් කළ යුතු ද යන්න දැන ගැනීම සඳහා අවශ්‍ය යයි තමාට පෙනෙන විස්තර තමා විසින් නියම කරනු ලබන කාලය තුළ තමා වෙත සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඒ විස්තර සපයන ලෙස එහි ලේකම්වරයාට හෝ ලේකම්වරයාගේ කාර්ය ඉටුකරන සංස්ථාවේ වෙනත් යම් නිලධරයකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන විස්තර රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරන කාලයක් ඇතුළත හෝ ඔහු විසින් තවදුරටත් ඉඩදිය හැකි කාලයක් තුළ සැපයීම නොකරන යම් තැනැත්තෙකු හෝ සත්‍ය නොවන විස්තර සපයන යම් තැනැත්තකු වරදක් කරන අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන්, පසු මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී, අධිකරණය විසින් කරනු ලබන ආඥාවේ නිශ්චිත ලෙස සඳහන් කරනු ලබන විස්තර හෝ නිවැරදි කළ විස්තර, ඒ ආඥාවේ සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයන ලෙස හෝ සැපයීමට සලස්වන ලෙස ඒ තැනැත්තාට ආඥා කිරීම සුදුසු යයි අධිකරණය අදහස් කරන අවස්ථාවක අධිකරණය විසින් එසේ ආඥා කළ හැකි ය.

(4) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක් මේ පනත යටතේ ලියාපදිංචි කළ යුතු බව හෝ ලියාපදිංචි කර ඇති විස්තරවල වෙනසක් කළ යුතු බව එසේ සපයන ලද යම් තොරතුරකින් රෙජිස්ට්‍රාර්වරයාට පෙනී ගියහොත්, ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට ඉඩදෙනු ලබන කාලයක් තුළ දී තමා වෙත අවශ්‍ය කරනු ලබන විස්තර සපයන ලෙස ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය ; එහෙත්, මේ පනත යටතේ යම් පැහැර හැරීමක් කර ඇති බව මේ වගන්තිය යටතේ ලබාගත් තොරතුරුවලින් අනාවරණය වූ අවස්ථාවක, මේ වගන්තිය යටතේ යම් කාලයක් ඇතුළත තමා වෙත විස්තර සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට නියම කරනු ලැබ ඇති විටක, ඒ කාලය ඉකුත් වීමට පෙර, ඒ තැනැත්තාට විරුද්ධව මේ පනත යටතේ නඩු කටයුතු ආරම්භ නොකළ යුතු ය.

සෝදිසි කර බැලීමේ බලය.

**17.** (1) මේ පනත යටතේ කාර්ය ඉටුකිරීම පිණිස තමාට අවශ්‍ය තොරතුරු තමා වෙත සපයනු නොලැබීමට ඉඩ ඇති බව තමා අදහස් කරන්නේ නම් හෝ ඒ තොරතුරු යටපත් කරනු ඇතැයි තමා සැක කරන්නේ නම්, ඒ තොරතුරු දැන ගැනීමේ කාර්යය සඳහා සෝදිසි කර බලා රෙජිස්ට්‍රාර්වරයා නියම කරන තොරතුරු ලබා ගන්නා ලෙස ඒ කාර්යය සඳහා පත් කර ඇති නිලධරයකුට රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් බලය පැවරිය හැකි අතර ඒ බලය පැවරීම ඒ කාර්යය සඳහා තබා ගෙන පවත්වාගෙන යන ලේඛනයේ සටහන් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ යම් තොරතුරක් දැන ගැනීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින්, අවශ්‍ය නම්, සාම නිලධරයකු ද කැටුව යා හැකි අතර පහත දැක්වෙන ක්‍රියා අතුරින් යම් ක්‍රියාවක් හෝ ඒ ක්‍රියා සියල්ලක් ම හෝ කරනු ලැබිය හැකි ය :—

(අ) යම් තැනැත්තකුට හෝ ව්‍යාපාර ආයතනයකට අයිති වන්නා වූ යම් පොත්, ලේඛන හෝ වෙනත් ලියකියවිලි යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක තිබිය හැකි බවට තමාට විශ්වාස කිරීමට හේතු ඇති විටක ඒ ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ඇතුල් වී පරීක්ෂා කිරීම සහ ඒ පොත්, ලේඛන හෝ ලියකියවිලි පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කරනු ලැබීමට සැලැස්වීම ;

(ආ) යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පරීක්ෂා කරන අතරතුර දී හමුවන යම් පොතකින්, ලේඛනයකින් හෝ ලියකියවිල්ලකින් සටහන් කර ගැනීම, ඉන්වෙන්ටරියක් සකස් කිරීම හෝ උධෘතයන් ගැනීම ;

(ඇ) ඒ ගොඩනැගිල්ල හෝ ස්ථානය තුළ සිට ඔහුට හමුවන යම් තැනැත්තකුගෙන්, මේ පනතට අදාළ වන්නා වූ හෝ ඒ යටතේ වූ යම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම ; මේ වගන්තිය යටතේ කරනු ලබන සෝදිසි කිරීම්වලට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සෝදිසි කිරීම්වලට අදාළ විධිවිධාන ම හැකිතාක් දුරට අදාළ විය යුතු ය ; තව ද

(ඈ) යම් ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් සෝදිසි කර බලන අතරතුර හමුවන යම් පොතක්, ලේඛනයක් හෝ වෙනත් ලියකියවිල්ලක් ඉවතට ගෙන යාම සහ එය ඉවත් කර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගේ භාරකාරත්වයෙන් ද, ඒ තැනැත්තාට ඒ වෙනුවෙන් ලදුපතක් නිකුත් කිරීම සහ (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද ලේඛනයෙහි ඒ පොත්, ලේඛන හෝ වෙනත් ලියකියවිලි පිළිබඳ විස්තර අප්‍රමාදව ඇතුළත් කිරීම.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලක් මගින් විශේෂයෙන් බලය පවරන ලද යම් නිලධරයකු විසින් නියම කරනු ලැබූ අවස්ථාවක එසේ යම් තොරතුරක් සැපයීමට හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට හෝ අපොහොසත් වන්නා වූ හෝ ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් පරීක්ෂා කිරීමක් කරගෙන යාමට බාධා කරන හෝ ඉඩදීමට අපොහොසත් වන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තෙක්, සංස්ථාවක්, අනුයෝජිතයෙක්, අධ්‍යක්ෂවරයෙක්, නිලධරයෙක් හෝ එවැනි ව්‍යාපාර ආයතනයක හෝ තැනැත්තකුගේ සේවානියුක්තයෙක්, වරද කරන ලද්දේ තමාගේ දැනම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔහු විසින් ඔප්පු කරන්නේ නම් මිස, වරදකට වරදකරු විය යුතු ය. එවැනි වරදකට මේ පනත යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථා

වක, වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වූ සෑම තැනැත්තෙක් ම, ඒ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු මාස දොළහක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් දෙදහසක් නොඉක්මවන්නා වූ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් කරනු ලැබිය යුතු ය.

**රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රකාශය ගොනු කිරීම සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සහ නාම පුවරුවක් හා අංකය ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව.**

**18.** (1) මේ පනත ප්‍රකාර යම් ව්‍යාපාර ආයතනයකින් හෝ තැනැත්තකුගෙන් ප්‍රකාශයක් ලැබුණු පසු, මේ පනතේ විධිවිධානවලට යටත්ව, රෙජිස්ට්‍රාර්වරයා විසින් එය ලියාපදිංචි කිරීමට සහ ගොනු කර තැබීමට සැලැස්විය යුතු අතර, ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඔහු විසින් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට තැපැල් මගින් යැවීම හෝ භාරදීම කළ යුතු ය :

එසේ වුව ද, මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව නිකුත් කරනු ලැබූ, ව්‍යාපාර ආයතනයක හෝ තැනැත්තකුගේ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක්, මේ වගන්තිය යටතේ වලංගු සහතිකයක් නිකුත් කරන තෙක්, 6 වන වගන්තියට යටත්ව සියලු කාර්ය සඳහා වලංගු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබූ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින්, එය ලැබී දින දහහතරක් ඇතුළත, ඒ සහතිකය හෝ එහි සහතික කරන ලද පිටපතක් ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ සහ ව්‍යාපාරය කරගෙන යන සෙසු සෑම ස්ථානයකම ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ සෑම තැනැත්තකු ම හෝ ව්‍යාපාර ආයතනයක් ම විසින්—

(i) ව්‍යාපාරය කරගෙන යන්නා වූ සෑම ස්ථානයක ම පිටත පහසුවෙන් කියවිය හැකි අකුරෙන් ප්‍රකටව පෙනෙන ස්ථානයක ඒ ව්‍යාපාර නාමය සහ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය පින්තාරු කිරීමට හෝ අලවා තැබීමට සැලැස්විය යුතු ය ;

(ii) සිය ලිපි ශීර්ෂවල—

(අ) පුද්ගලයකු විසින් කරගෙන යන්නා වූ හෝ (හවුල්කරුවන්ගෙන් එක් හවුල්කරුවකුවත් සංස්ථාවක් නොවන) ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් විසින් කරගෙන යන්නා වූ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, ව්‍යාපාර නාමය සහ ව්‍යාපාරය කරගෙන යන්නා වූ පුද්ගලයාගේ නම හෝ සියලු හවුල්කරුවන්ගේ නම් සහ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ;

(ආ) (හවුල්කරුවන්ගෙන් එක් අයකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සංස්ථාවක් වන) ව්‍යාපාර ආයතනයක හවුල් කරුවන් විසින් කරගෙන යන්නා වූ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, ලියාපදිංචි කළ ව්‍යාපාර නාමය, පුද්ගලයකු වන්නා වූ හවුල්කරුගේ හෝ පුද්ගලයන් වන්නාවූ හවුල්කරුවන්ගේ නම හෝ නම් සහ සංස්ථා නාමය සහ සංස්ථා වන සියලු හවුල්කරුවන්ගේ සංස්ථාගත කිරීමේ විස්තර සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ;

(ඇ) සංස්ථාවක් විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විටක, සංස්ථා නාමය සහ ඒ සංස්ථාව සංස්ථාගත කිරීමේ විස්තර සහ ව්‍යාපාරයේ ලියාපදිංචි කිරීමේ අංකය සහ ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ;

සඳහන් කරනු ලැබිය යුතු ය.

(iii) සිය ලදුපත්වල සහ ඉන්වොයිස්වල—

(අ) ව්‍යාපාරයේ නාමය ; සහ

(ආ) ව්‍යාපාරයේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය

සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද සෑම ව්‍යාපාර ආයතනයක් ම හෝ තැනැත්තකු ම විසින් මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(5) (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබුවහොත්, එසේ පැහැර හැරීම කරන සෑම තැනැත්තකුම හා ඒ තැනැත්තා ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම සහ සංස්ථාවක් සම්බන්ධයෙන් වන අවස්ථාවක. එහි සෑම අධ්‍යක්ෂවරයකුම සහ ලේකම්වරයා ද වරදක් කරන අතර, ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(6) යම් ප්‍රකාශයක් ලියාපදිංචි කිරීම හෝ ඒ ලියාපදිංචි කිරීම පිළිබඳ සහතිකය හෝ ඒ ප්‍රකාශය සපයන තැනැත්තාට එරෙහිව හැර, ඒ ප්‍රකාශයෙහි විස්තර පිළිබඳ සත්‍යතාව සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන හෝ අන්‍යාකාර සාක්ෂ්‍ය වශයෙන් තෝරුම් නොගත යුතු ය.

සූචියක් තැබිය යුතු බව.

19. මෙම පනත යටතේ ලියාපදිංචි කරන ලද සියලු ව්‍යාපාර ආයතන හා තැනැත්තන් පිළිබඳ සූචියක්, ලියාපදිංචි කිරීමේ අනු ක්‍රමික අංකය ද සමග එක් එක් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි රෙජිස්ට්‍රාර්වරයා විසින් තැබිය යුතු අතර, ශ්‍රී ලංකාව පුරා පිහිටි එක් එක් කාර්යාලයෙහි ලියාපදිංචි කරන ලද සියලු ව්‍යාපාර ආයතනවල හා තැනැත්තන්ගේ ව්‍යාපාර නාම පිළිබඳ පොදු සූචියක් ප්‍රධාන කාර්යාලයේ තැබිය යුතු ය.

අවසන් කිරීමේ/ දැන්වීම් සහ ලේඛනයෙන් නාමය ඉවත් කිරීම.

20. (1) මෙම පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ව්‍යාපාර ආයතනයක් විසින් හෝ තැනැත්තකු විසින් ස්වකීය ව්‍යාපාර කටයුතු ව්‍යාපාර නාමයක් යටතේ කරගෙන යාම නතර කරනු ලැබුව හොත්, එසේ නතර කරන ලද අවස්ථාවේ සිට මාස තුනක් ඇතුළත, ඒ ව්‍යාපාර ආයතනය විසින් හෝ තැනැත්තා විසින් ඒ ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම අවසාන කර ඇති බවට නියමිත ආකෘතියෙහි වූ ප්‍රකාශයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත තැපැල් මගින් යැවීම හෝ භාරදීම, ව්‍යාපාර කටයුතු කරගෙන යාම නතර කරන ලද අවස්ථාවේ දී ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන් වූ තැනැත්තන්ගේ හෝ පුද්ගලයාගේ හෝ ඒ පුද්ගලයා මියගොස් නම් ඔහුගේ පෞද්ගලික නියෝජිතයාගේ හෝ, සංස්ථාවක් සම්බන්ධයෙන් වන විටක, එහි සෑම අධ්‍යක්ෂවරයකුගේ ම හෝ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කරන ලද ප්‍රකාශය දීම ස්වකීය කාර්යයව තිබුණු යම් තැනැත්තකු විසින් ඉහත කී කාලය ඇතුළත දී එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඔහු වරදක් කරන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය ලැබුණු විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් එය ගොනුකර තැබිය යුතු අතර, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ලියාපදිංචි කිරීම ලේඛනයෙන් ඉවත් කරමින් ලේඛනයෙහි සටහනක් කළ යුතු ය.

(4) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ලියාපදිංචි කළ නාමය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයන බව විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇති විටෙක—

(අ) ගැසට් පත්‍රයේ දැන්වීම පළ කිරීමෙන් මාසයක් ඇතුළත තමා වෙත විරෝධතා නොලැබුණහොත්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ලේඛනයෙන් ඉවත් කරනු බව සඳහන් කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළකිරීමට ; සහ

(ආ) ඒ දැන්වීමේ පිටපතක් ඒ දැන්වීමෙහි සඳහන් ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට සහ එක් එක් හවුල්කරුවාට ඔහුගේ වාසස්ථානයේ ලිපිනයට, ලියාපදිංචි කළ තැපෑලෙන් නොපමාව යැවීමට

ඔහු විසින් සැලැස්විය යුතු ය.

(5) එකී දැන්වීම යවනු ලැබීමෙන් පසු එක් මාසයක් ඇතුළත, එකී දැන්වීම පිළිබඳ විරෝධතාවක් රෙජිස්ට්‍රාර්වරයා වෙත නොලැබුණ හොත්, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ඔහු විසින් ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට ඇති බලය.

21. (1) යම් ව්‍යාපාර නාමයක් භාවිතා කිරීම තත් කාලයෙහි බලපවත්නා වූ යම් නීතියකට පටහැනි වන බවට හෝ භාවිතා කිරීම 8 වන වගන්තිය යටතේ තහනම් කරන ලද ව්‍යාපාර නාමයක් බවට හෝ රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඒ ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ලියාපදිංචි කිරීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමට පරිබාහිරව, එය භාවිත කිරීම තහනම් කරනු ලැබිය හැකි නම්, එය භාවිත කිරීමට ඒ ලියාපදිංචි කිරීම මගින් බලය දෙන ලෙස තේරුම් නොගත යුතු ය.

ලියාපදිංචි කිරීම අවසාන කිරීමට ඇති බලය.

22. (1) ලියාපදිංචි කිරීමක් ප්‍රතික්ෂේප කිරීමට 21 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් බලය ලැබී ඇත්තේ යම් හේතු මත ද ඒ හේතු අතුරින් හේතුවක් මත, ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් ව්‍යාපාර ආයතනයක හෝ තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, රෙජිස්ට්‍රාර්වරයා විසින් අවසන් කරනු ලැබිය හැකි ය.

(2) ව්‍යාපාර නාමය වෙනස් කිරීම සඳහා තමාට පිළිගත හැකි පියවර දැන්වීමෙහි සඳහන් කරන ලද කාලසීමාව තුළදී ගන්නා ලෙස ඒ ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාරය කරගෙන යන ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට දන්වමින් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරන ලද තැපෑලෙන් දැන්වීමක් යවනු ලැබ තිබේ නම් මිස, (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවසන් කිරීම නො කළ යුතු ය.

(3) ව්‍යාපාර නාමය වෙනස් කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට පිළිගත හැකි පියවර (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමෙහි සඳහන් කරන ලද කාලසීමාව ඇතුළත ගැනීමට ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ කාලසීමාව අවසානයේදී ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් අවසන් කළ යුතු අතර, ඒ ව්‍යාපාර ආයතනයේ හෝ තැනැත්තාගේ නාමය ද ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

ප්‍රතික්ෂේප කරන ලද හෝ අවසන් කරන ලද ව්‍යාපාර නාමයක් භාවිතා කිරීම සඳහා දණ්ඩනය.

23. මේ පනත යටතේ ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ අවසන් කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යාපාර නාමය දිගටම භාවිතා කරන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට සහ වරද කරනු ලැබීමෙන් පසු වරද දිගටම කරනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් සියයක අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අවසන් කිරීම පිළිබඳ දැන්වීම.

**24.** රෙජිස්ට්‍රාර්වරයා විසින් ව්‍යාපාර නාමයක් ලියා පදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන හෝ 20 වන, 21 වන හෝ 22 වන වගන්ති යටතේ යම් ව්‍යාපාර ආයතනයක හෝ තැනැත්තකුගේ ලියාපදිංචි කිරීම ඉවත් කරන හෝ අවසන් කරන අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කිරීම, ඉවත් කිරීම හෝ අවසන් කිරීම පිළිබඳ දැන්වීම, ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට ලියාපදිංචි කරන ලද තැපැලෙන් යවනු ලැබිය යුතු ය.

අභියාචනා.

**25.** මේ පනතේ විධිවිධාන යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ගන්නා ලද යම් තීරණයකින් හෝ කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ තීරණය හෝ නියමය තමා වෙත ලියවිල්ලකින් දැනුම් දීමෙන් පසු දින තිහක් ඇතුළත ඊට විරුද්ධව උචිත දිසා අධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම.

**26.** යම් අධිකරණයක් ඉදිරියෙහි පවත්නා සියලු නඩු කටයුතුවල දී —

(අ) යම් මුද්දරයක් සපයන ලෙස හෝ යම් මුද්දර ගාස්තුවක් ගෙවන ලෙස රෙජිස්ට්‍රාර්වරයාට නියම කරනු නොලැබිය යුතු ය ;

(ආ) රෙජිස්ට්‍රාර්වරයාගේ නඩු ගාස්තු අධිකරණයේ අභිමතය පරිදි විය යුතු වුවත්, වෙනත් යම් පාර්ශ්වකරුවකුගේ නඩු ගාස්තු ගෙවන ලෙස රෙජිස්ට්‍රාර්වරයාට ආඥා කරනු නොලැබිය යුතු ය.

ලියාපදිංචි කරන ලද ප්‍රකාශ පරීක්ෂා කිරීම සහ සහතික කළ පිටපත් නිකුත් කිරීම.

**27.** (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් ගොනු කර තබා ඇති ලේඛන, නියම කරනු ලබන ගාස්තු ගෙවා, යම් තැනැත්තකු විසින් පරීක්ෂා කර බලනු ලැබිය හැකි ය.

(2) යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ යම් නියමිත ආකෘතියක කරන ලද යම් ප්‍රකාශයක පිටපතක් හෝ ඡායාස්ථිත පිටපතක් හෝ උධෘතයක් රෙජිස්ට්‍රාර්වරයා ලවා සහතික කරවා ගැනීම පිණිස යම් තැනැත්තකු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. ඒ සහතිකය, සහතික කරන ලද පිටපත හෝ උධෘතය සඳහා නියම කරනු ලබන ගාස්තුව ගෙවිය යුතු ය.

(3) ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ මේ පනත යටතේ සපයන ලද හෝ ලියාපදිංචි කරන ලද ප්‍රකාශයක පිටපතක් හෝ ඡායාස්ථිත පිටපතක් හෝ උධෘතයක්, එය සත්‍ය පිටපතක් බවට රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සනින් යථා පරිදි සහතික කොට තිබේ නම්, (එය අත්සන් කරන ලද්දේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බව ඔප්පු කිරීම අවශ්‍ය නොවේ) සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී සාක්ෂ්‍ය වශයෙන් භාරගත යුතු ය.

යම් වාර්තා ලේඛනයක හානි වූ වෙළුමක හෝ හානි වූ ලිපි ගොනුවක හෝ ලේඛනයක පිටපත් ගැනීමේ සහ නැවත සකස් කළ පත් ඉරු සකස් කොට ඇතුළත් කිරීමේ බලය.

28. (1) මේ පනත යටතේ තබා ඇති යම් වාර්තා ලේඛනයක යම් වෙළුමක් හෝ ලිපිගොනුවක් හෝ ලේඛනයක් අළුත්වැඩියා කළ නොහැකි සේ හානි වී ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ වෙළුමේ ලිපි ගොනුවේ හෝ ලේඛනයේ පිටපතක් ඔහු විසින් විධාන කරනු ලබන ආකාරයට සකස් කිරීමට සහ සත්‍යොක්ෂණය කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ සාදනු ලැබ, සත්‍යොක්ෂණය කරන ලද යම් පිටපතක්, එය පිටපත වූයේ යම් වෙළුමක ද, පත් ඉරුවක ද නැතහොත් ලේඛනයක ද, ඒ වෙළුම, පත් ඉරුව හෝ ලේඛනය වෙනුවට ප්‍රතියෝජනය කළ යුතු අතර, ඒ පිටපත ප්‍රතියෝජනය කළ වෙළුමේ, ලිපිගොනුවේ හෝ ලේඛනයේ තුබූ නෛතික බලපෑමම ඊට සියලු කාර්යය සඳහා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පිටපතක් සාදනු ලැබූ හානියට පත් සෑම වෙළුමක්ම, ලිපිගොනුවක්ම හෝ ලේඛනයක් ම, අවශ්‍ය වන පරිශීලනය කිරීම සඳහා, සාධාරණව තබාගත හැකිනාක් කාලයක් තබා ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(4) යම් වාර්තා ලේඛනයක වෙළුමක හෝ ලිපිගොනුවක වූ යම් පත්ඉරුවක් නැතිවී, සොයාගත නොහැකි බවට හෝ ඒ පත් ඉරුව ස්ථිර ලෙස විච්ඡේදනය වී ඇති බවට හෝ එහි ඇති සටහන් හෝ ඒ සටහන්වල යම් වැදගත් කොටසක් කියවීමට නොහැකි වන පරිදි මැකී ගිය බවට හෝ හානියට පත්වී ඇති බවට, නිසි පරීක්ෂණයකින් පසු රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, නැවත සකස් කළ පත් ඉරුවක් පිළියෙළ කිරීමට ඔහු විසින් සැලැස්විය හැකි ය.

(5) පහත සඳහන් කරුණු සඳහා විධිවිධාන සලස්වන නියෝග වලට අනුව හැර, (4) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලස්වන ලද පරිදි කිසිදු පත්ඉරුවක් නැවත සකස් කරනු නොලැබිය යුතු ය :—

(අ) නැති වූ හෝ විච්ඡේදනය වූ හෝ හානියට පත් වූ පත්ඉරුවේ මුලින් ඇතුළත් වූ විස්තර දැන ගැනීම සඳහා රෙජිස්ට්‍රාර් වරයා විසින් සාක්ෂ්‍ය පිළිගැනීම හා යොදා ගැනීම;

(ආ) නැවත සකස් කරන ලද පත්ඉරුව පිළියෙල කිරීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනුම් දීම;

(ඇ) නැවත සකස් කරන ලද පත්ඉරුවේ ඇතුළත් වන විස්තර වලින් යම් විස්තරයකින් බලපෑමක් සිදු වූ යම් තැනැත්තකු විසින් විරෝධතා ඉදිරිපත් කිරීම; සහ

(ඈ) එවැනි යම් විරෝධතා ගැන රෙජිස්ට්‍රාර්වරයා විසින් විභාග කිරීම.

(6) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන ප්‍රකාර රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් පත්‍ර ඉරුවක් නැවත සකස් කරන ලද අවස්ථාවක, ඒ නැවත සකස් කරන ලද පත්‍ර ඉරුව රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකාරයට සතොයක්ෂණය කළ යුතු අතර, ඉන් පසුව, ඒ නැවත සකස් කරන ලද පත්‍ර ඉරුව, ලේඛනයේ නියමිත වෙළුමේ ඒ නැති වූ හෝ විච්ඡේදනය වූ හෝ හානියට පත් වූ පළමු පත්‍ර ඉරුව තිබුණු ස්ථානයේ ම හෝ, අවස්ථාවෝචිත පරිදි, මේ වගන්තියේ විධිවිධාන යටතේ සකස් කරන ලද වෙළුමක පිටපතකට ඇතුල් කිරීමට විධිවිධාන සැලැස්විය යුතු ය: නැවත සකස් කරන ලද පත්‍ර ඉරුව එසේ සතොයක්ෂණය කළ විට සහ ඇතුල් කළ විට, ඒ නැවත සකස් කරන ලද පත්‍ර ඉරුව ප්‍රතියෝජනය කළේ යම් පත්‍ර ඉරුවක් ද ඒ පත්‍ර ඉරුවට තිබුණ නෛතික බලය හා බල පෑම ඊට ද ඇති සේ සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(7) මේ පනතේ විධිවිධාන යටතේ තබා ඇති හෝ නිකුත් කරන ලද යම් වාර්තා ලේඛනයක හෝ යම් සහතිකයක, ලිපිගොනුවක හෝ ලියවිල්ලක සොයා ගනු ලබන යම් ලිපි දෝෂයක් හෝ අත්හැරීමක්, තමා විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් නිවැරදි කරනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා ඒ සහතිකය ආපසු කැඳවනු ලැබ සංශෝධනය කිරීම හෝ ඒ වෙනුවට අලුත් සහතිකයක් නිකුත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

දැන්වීම භාරදීම.

29. මේ පනතේ විධිවිධාන යටතේ දීමට හෝ භාරදීමට නියම කරනු ලැබ ඇති යම් දැන්වීමක්, ලිඛිත නිවේදනයක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක්, එය අමතනු ලැබූ තැනැත්තාගේ ලියාපදිංචි කළ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය වෙත රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් යවා ඇත්තේ නම්, එය යථා පරිදි දී ඇති ලෙස හෝ භාර දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

පරණ වාර්තා විනාශ කිරීම ආදිය.

30. භාර දී ඇති, ගොනු කර ඇති හෝ ලියාපදිංචි කර ඇති අවුරුදු හතකට අඩු නොවූ යම් ලේඛනයක් රඳවා තබා ගැනීම තවදුරටත් අවශ්‍ය හෝ යෝග්‍ය නොවන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, එය විනාශ කිරීම හෝ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට දීම හෝ තම අදහස බව ගැසට් පත්‍රයේ එක් මාසයක දැනුම් දීමක් කිරීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින් එය එසේ විනාශ කිරීම හෝ භාර දීම කළ හැකි ය.

සහතික කරන ලද පිටපත් සාක්ෂ්‍ය විය යුතු බව.

31. මේ පනත යටතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයේ ගොනු කර ඇති හෝ තබා ඇති යම් ලේඛනවල, වාර්තා ලේඛනවල හෝ වෙනත් පොත්වල හෝ ඉන් ලබාගත් මුද්‍රිත, ඡායාස්පිත, යන්ත්‍රානුසාරයෙන්, විද්‍යුත් අනුසාරයෙන් හෝ අන්‍යා කාරයකින් නිෂ්පාදිත, යතුරු ලේඛනය කළ හෝ ලිඛිත පිටපත් හෝ උධෘත රෙජිස්ට්‍රාර්වරයා විසින් (රෙජිස්ට්‍රාර්වරයා බව ඔප්පු කිරීම අවශ්‍ය නොවන්නේ ය.) යථා පරිදි සහතික කරනු ලැබ තිබේ නම් වැඩිදුර ඔප්පු කිරීමක් හෝ මුල් පිටපත් ඉදිරිපත් කිරීමක් හෝ නොමැතිව ශ්‍රී ලංකාවේ සියලු අධිකරණයන්හි දී සහ සියලු නඩු කටයුතුවල දී සාක්ෂ්‍ය වශයෙන් භාරගනු ලැබිය යුතු ය.

ඉල්ලීම අහෝසි වූ ලෙස සැලකීමට රෙජිස්ට්‍රාර් ඇති බලය. වරණට

32. (1) ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු මේ පනතේ 5 වන, 6 වන හෝ 9 වන වගන්තිය යටතේ විස්තර ප්‍රකාශයක් සපයා ඇති නමුත් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම පිණිස, රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබූ විස්තර සැපයීම හෝ ලියවිල්ලකින් නියම කරනු ලැබූ යම් සංශෝධන මුල් ඉල්ලීමෙහි ඇතුළත් කිරීම පැහැර හැරි අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා නියම කරන විස්තර සපයන ලෙස හෝ ඔහු නියම කරන සංශෝධන ඉල්ලීමෙහි ඇතුළත් කරන ලෙස හෝ ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකෘතියෙහි නිකුත් කරනු ලැබිය හැකි ය; එක් මාසයක කාලයක් ඇතුළත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් දෙනු ලබන ඊට වැඩි කාලයක් ඇතුළත ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ඒ දැන්වීමෙහි සඳහන් කරුණු ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත්, ඒ ඉල්ලීම අහෝසි වූ ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලැබිය හැකි අතර, ඒ මත සහතිකයක් නිකුත් කිරීම සඳහා තවදුරටත් ක්‍රියා නොකර සිටිය හැකි ය:

එසේ වුව ද, මුල් ඉල්ලීම මත නියම කරනු ලබන වැඩිමනත් ගාස්තුවක් ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ගෙවනු ලබන්නේ නම් සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබූ ඒ විස්තර සපයන්නේ නම් හෝ ඔහු විසින් නියම කරනු ලැබූ සංශෝධනය මුල් ඉල්ලීමෙහි ඇතුළත් කරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ අහෝසි වූ ඉල්ලීම මත තවදුරටත් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කිරීම මේ වගන්තිය යටතේ අහෝසි වූ ව්‍යාපාර නාමයක් පාවිච්චි කිරීම, අඛණ්ඩව කරගෙන යන යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ප්‍රකාර කටයුතු කිරීමට පියවර ගෙන නොමැති නම්, ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිටදී ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හා වරදකරු කරනු ලැබීමෙන් පසු වරද අඛණ්ඩව කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහා රුපියල් එක් සියයක අඛණ්ඩ දඩයකටද ඔහු යටත් විය යුතු ය.

නියෝග සෑදීමේ බලය.

33. (1) පහත දැක්වෙන කරුණු අතුරින් කිසිවක් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු ගාස්තු;

(ආ) මේ පනත යටතේ භාවිත කළ යුතු ආකෘති;

(ඇ) මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉටු කළ යුතු කාර්ය;

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ පනත යටතේ කිරීමට නියමිත වූ ක්‍රියා ඉටු කිරීම;

(ඉ) පත්ඉරු නැවත සකස් කිරීම;

(ඊ) නියම කළ හැකි සියලු කරුණු සහ සාමාන්‍යයෙන්, මේ පනත යටතේ ලියාපදිංචි කිරීම පවත්වාගෙන යාම සහ විධිමත් කිරීම හා ඊට ආනුෂංගික කරුණු.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතු නමුත්, එය යටතේ එතෙක් කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය ලෙස සල කනු ලබන දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අසත්‍ය ප්‍රකාශ හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කරනු ලැබූ බවට අසත්‍ය ලෙස කරුණු දැක්වීම සම්බන්ධයෙන් දණ්ඩන.

34. (1) (අ) ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කර නොමැතිව තිබිය දී දැන දැනම එය ලියාපදිංචි කර ඇති බවට කරුණු දක්වන හෝ ව්‍යාපාර නාමය සමඟ සාවද්‍ය හෝ අසත්‍ය අංකයක් දැන දැනම භාවිත කරන ;

(ආ) මේ පනත යටතේ යම් ප්‍රකාශයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් අසත්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන හෝ දෙන හෝ ඉදිරිපත් කිරීමට හෝ දීමට සලස්වන,

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරි පිට දී ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) තැනැත්තෙක් ව්‍යාපාර නාමයක් සමඟ "ලියාපදිංචි කළ" යන වචන හෝ ලියාපදිංචි කිරීම ලබාගෙන ඇති බව හඟවන යම් කෙටි යෙදුමක් හෝ අකුරක් හෝ වචනයක් හෝ වඩන පාවිච්චි කරන්නේ නම් හෝ ව්‍යාපාර නාමය සම්බන්ධයෙන්, ඒ ව්‍යාපාර නාමය මේ පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරනු ලැබ ඇති බව විශ්වාස කරනු පිණිස මහජනයා නොමඟ යැවීමට වැරදි හෝ අසත්‍ය අංකයක් පාවිච්චි කරන්නේ නම්, ඒ ව්‍යාපාර නාමය ලියා පදිංචි කර ඇති බවට ඒ තැනැත්තා විසින් මේ වගන්තියේ කාර්ය සඳහා කරුණු දක්වන ලෙස සැලකිය යුතු ය.

35. සංස්ථාවක් විසින් මේ පනත යටතේ වරදක් කරන ලද අවස්ථාවක, වරද කරනු ලබන අවස්ථාවේ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු ව, සාමාන්‍යාධිකාරිවරයකු ව, ලේකම්වරයකු ව හෝ වෙනත් සමාන නිලධරයකු ව සිටි හෝ ඒ තත්ත්වයෙන් ක්‍රියා කිරීමට බැඳී සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කරන ලද්දේ තමාගේ කැමැත්ත හෝ දැනුම ඇතිව නොවන බවත්, ඒ තත්ත්වයෙහි ලා තම කර්තව්‍ය වල ස්වභාවය සහ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන වරද කිරීම වැළැක්වීම සඳහා තමා සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවත් ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරද කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථා විසින් කරන වැරදි.

36. (1) යම් විස්තර පිළිබඳ ප්‍රකාශයක් හෝ විස්තරවල වෙනස් කිරීමක් පිළිබඳ ප්‍රකාශයක් හෝ මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත සැපයීමට හෝ භාරදීමට හෝ යැවීමට මේ පනතේ යම් විධිවිධානයකින් යම් ව්‍යාපාර ආයතනයකට හෝ තැනැත්තකුට නියම කර ඇති විටක ඒ ව්‍යාපාර ආයතනය හෝ තැනැත්තා විසින් ඒ විධිවිධානය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති සහ ඒ පැහැර හැරීම හේතු කොට ගෙන ඒ ව්‍යාපාර ආයතනය විසින් හෝ තැනැත්තා විසින් මේ පනතට විරුද්ධව වරදක් කරනු ලැබ ඇති අවස්ථාවක, අධිකරණයක නඩු කටයුතු පැවරීම වෙනුවට හෝ එවැනි නඩු කටයුතු දැනටමත් පවරා තිබේ නම්, ඒ වරද සම්බන්ධයෙන් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට විරුද්ධව ඒ නඩු කටයුතු තවදුරටත් කරගෙන යාම වෙනුවට, රෙජිස්ට්‍රාර්වරයා සුදුසු යයි අදහස් කරන්නේ නම්, ඒ ව්‍යාපාර ආයතනයෙන් හෝ තැනැත්තාගෙන් වරදට වන්දි වශයෙන් රෙජිස්ට්‍රාර්වරයා සුදුසු යයි අදහස් කරන මුදලක් භාර ගනු ලැබිය හැකි අතර, එසේ භාරගනු ලබන යම් මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය ; තවද එසේ වරදට වන්දි වශයෙන් භාරගන්නා ලද සෑම මුදලක්ම පිළිබඳ වාර්තා සටහන රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගන්නා සහ පවත්වාගෙන යන වාර්තා ලේඛනයක සටහන් කරනු ලැබිය යුතු ය.

ඇතැම් වැරදි සමථයකට පත් කිරීම.

(2) යම් වරදකට වන්දි වශයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ යම් මුදලක් රෙජිස්ට්‍රාර්වරයා විසින් භාර ගන්නා ලද අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් ඒ ව්‍යාපාර ආයතනයට හෝ තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම හෝ එවකටත් නඩු කටයුතු පවරනු ලැබ ඇති නම් ඒ නඩු කටයුතු තවදුරටත් කර ගෙන යාම හෝ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ වරදකට වන්දි වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරන ලද දින සිට එක් මාසයක් ඇතුළත හෝ ඔහු විසින් ඉඩ දෙනු ලබන ඊට වැඩි කාලයක් ඇතුළත නොගෙවා ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හැරීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කළ යුතු අතර, එසේ ගෙවීම පැහැර හරින ලද මුදල, අධිකරණයකින් පනවන ලද දඩයක් අය කරගන්නා ආකාර

යට ම ඒ ව්‍යාපාර ආයතනයෙන් හෝ තැනැත්තාගෙන් අය කරගනු ලැබිය යුතු ය ; තව ද ගෙවීම පැහැර හරින ලද එම මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලෙස ඒ අධිකරණය විසින් විධාන කරනු ලැබිය යුතු ය.

දේශීය කළමනාකරු විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර.

37. (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට නියමිත යම් පුද්ගලයකු හෝ යම් ව්‍යාපාර ආයතනයක සියලු හවුල්කරුවන් හෝ යම් සංස්ථාවක සියලු අධ්‍යක්ෂවරයන් හා ලේකම්වරයා ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින අවස්ථාවක ඒ පුද්ගලයාගේ, ව්‍යාපාර ආයතනයේ හෝ සංස්ථාවේ ව්‍යාපාරය ඒ පුද්ගලයාගේ හෝ ව්‍යාපාර ආයතනයේ හෝ සංස්ථාවේ නමින් දේශීය කළමනාකරුවකු විසින් ලංකාවේ පවත්වාගෙන යනු ලැබිය යුතු ය ; තවද, මේ පනත යටතේ ඒ පුද්ගලයා, ව්‍යාපාර ආයතනය හෝ සංස්ථාව විසින් ඉටු කළ යුතු සියලු බැදීම් ඉටු කිරීම සම්බන්ධයෙන් ඒ දේශීය කළමනාකරු පෞද්ගලිකව වගකිව යුතු ය.

(2) යම් ව්‍යාපාරයක් සඳහා (1) වන උපවගන්තිය අනුව දේශීය කළමනාකරුවකු පත්කර නොමැති බව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දී ඇති අවස්ථාවක, ඒ උපවගන්තියේ නියමයන්ට අනුකූලව කටයුතු කරන ලෙස, ඒ පුද්ගලයාට හෝ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන්ට හෝ ඒ සංස්ථාවේ සියලු අධ්‍යක්ෂවරයන්ට හා ලේකම්වරුන්ට රෙජිස්ට්‍රාර්වරයා විසින් දැනුම් දෙනු ලැබිය හැකි ය.

ඒ දැන්වීම කිරීමෙන් තුන් මාසයක කාලසීමාවක් ඇතුළත ඒ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඒ පුද්ගලයාගේ, ව්‍යාපාර ආයතනයේ හෝ සංස්ථාවේ ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් අස් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දේශීය කළමනාකරු විසින් යම් බැදීමක් සම්බන්ධයෙන් යම් පැහැර හැරීමක් කළ අවස්ථාවක දී, ඔහු ඒ ව්‍යාපාරය කරගෙන යන්නේ යම් පුද්ගලයකුගේ නාමයෙන් ද, ඒ පුද්ගලයා හෝ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු හෝ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයා හෝ අවස්ථාවෝචිත පරිදි, යටත් විය යුතු වගකීම්වලටම හා දණ්ඩනවලටම ඔහු යටත් විය යුතු ය. තවද මේ පනතේ සියලු දණ්ඩන හා වෙනත් විධිවිධාන ඒ අනුව, තේරුම් ගත යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "දේශීය කළමනාකරු" යන්නට, විදේශයක පදිංචි සහ ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර ස්ථානයක් ඇත්තා වූ යම් ව්‍යාපාර ආයතනයක් හෝ තැනැත්තකු සඳහා හෝ වෙනුවෙන් ලියවිල්ලකින් පත් කරන ලද හෝ ඇටෝර්නි බලයක් යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු හෝ ව්‍යාපාරය කරගෙන යන වෙක්පත් අත්සන් කරන හෝ තථ්‍ය කළමනාකරුවකු ලෙස ක්‍රියා කරන යම් තැනැත්තකු ඇතුළත් වේ.

**38.** මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත අභිමතානුසාරී බලතල පවරා දී ඇති අවස්ථාවක, ඉන් ආවේදිත පාර්ශ්වයට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා නොදී, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ බලතල ඒ පාර්ශ්වයට අහිතකර අන්දමින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(රෙජිස්ට්‍රාර්වරයා විසින් අභිමතානුසාරී බලතල ක්‍රියාත්මක කිරීම.)

**39.** මේ පනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා ගනු ලබන යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක හෝ වාර්තා ලේඛනයෙහි යම් ලියාපදිංචි කිරීමේ සටහනක කලින් කල සොයා ගනු ලබන යම් ලිපි දෝෂයක් අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලබන පරීක්ෂණයකින් පසු ඔහු විසින් නිවැරදි කළ හැකි ය.

(ලිපි දෝෂ නිවැරදි කිරීම.)

**40.** මේ පනතේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට විරුද්ධව නඩුවක් හෝ වෙනත් නීති කෘත්‍යයක් පවරනු නොලැබිය යුතු ය.

(රෙජිස්ට්‍රාර්වරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව.)

**41.** මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් පරිපාලනය කිරීමේ දී යම් සැකයක් හෝ දුෂ්කරතාවක් උද්ගත වූ අවස්ථාවක, ඒ කාරණය ගැන විධාන ලබාගැනීම පිණිස රෙජිස්ට්‍රාර්වරයා විසින් නීතිපතිවරයා වෙත හෝ සොලිසිටර් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(රෙජිස්ට්‍රාර්වරයා විසින් නීති නිලධරයන්ගේ විධාන පිළිපැදිය හැකි බව.)

**42.** රෙජිස්ට්‍රාර්වරයා, අතිරේක රෙජිස්ට්‍රාර්වරයා, සහකාර රෙජිස්ට්‍රාර්වරයන් හෝ තත් කාලයෙහි එවැනි යම් තනතුරක කටයුතු කරන යම් තැනැත්තෙක්, ඔහු ධුරය දරන තාක් කල්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(රෙජිස්ට්‍රාර්වරුන් රජයේ සේවකයන් වන බව.)

**43.** මේ පනතේ විධිවිධාන යටතේ තබා ගැනීමට හා පවත්වාගෙන යාමට නියමිත සියලු වාර්තා ලේඛන, රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය යටතේ, එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ කාර්යාලවල තබා ගැනීම හා පවත්වාගෙන යාම කළ යුතු ය.

(වාර්තා ලේඛන ආදිය පවත්වාගෙන යාම.)

## III වන කොටස

## උපදේශක කොමිෂන් සභාව පිහිටුවීම හා එහි බලතල

**44.** (1) ව්‍යාපාර නාම නීතියට අදාළව තමා වෙත යොමු කරන ලද යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීමේ කාර්ය සඳහා, අමාත්‍යවරයා විසින්—

(උපදේශක කොමිෂන් සභාව පත් කිරීම යනාදිය.)

(අ) යෝග්‍ය සුදුසුකම් ඇති පස් දෙනකට නොඅඩු සහ දහ දෙනකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "උපදේශක කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය හැකි ය; තවද

(ආ) ඒ තැනැත්තන්ගෙන් එක් අයකු එකී උපදේශක සභාවේ සභාපති ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) අමාත්‍යවරයා විසින් කලින් කල කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන, ව්‍යාපාර නාම සම්බන්ධයෙන් සහ ව්‍යාපාර නාමවලට අදාල වන නීතිය සම්බන්ධයෙන් වූ යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් ගැන පරීක්ෂා කර බලා අමාත්‍යවරයාට වාර්තා කිරීම ;

(ආ) ව්‍යාපාර නාමවලට සම්බන්ධ සහ ඊට අදාල වන නීතිය කලින් කල සමාලෝචනය කිරීම සහ ඒ නීතිය වෙනස් කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම සඳහා අමාත්‍යවරයාට යෝජනා ඉදිරිපත් කිරීම ;

(ඇ) (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් නිර්දේශයන් කිරීමේ දී, වෙළෙඳ මණ්ඩල, වෘත්තීය සංවිධාන, මුදල් ආයතන, ආණ්ඩුවේ අධිකාරීන් සහ මහජනයා සමග සාකච්ඡා කිරීම සහ ඒවායේ අදහස් සැලකිල්ලට ගැනීම අවශ්‍ය යයි කොමිෂන් සභාව අදහස් කරන අවස්ථාවක, එසේ සාකච්ඡා කිරීම සහ අදහස් සැලකිල්ලට ගැනීම කොමිෂන් සභාවේ කාර්ය විය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා උපදේශක කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයකු වන අතර, එකී කැඳවුම්කරු සහ ලේකම් ලෙසද කටයුතු කළ යුතු ය.

(4) උපදේශක කොමිෂන් සභාවේ කාර්ය ඉටු කිරීම සහ එකී බල තල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(5) (අ) (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු තුනක් වන්නේ ය :

එසේ වුවද ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන හෝ අන්‍ය කාරයකින් තම ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් තමා අනුප්‍රාප්තික වූයේ යම් සාමාජිකයකුටද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) (අ) කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කළ උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(ආ) අමාත්‍යවරයා අමතා ලිපියක් යැවීමෙන් තම ධුරයෙන් ඉල්ලා අස්වීමට උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයකුට හැකි ය.

(ඇ) උපදේශක කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් යහපත් පැවැත්මකින් යුක්තව සිටින තාක් කල් ධුරය දැරිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඇ) අයහපත් සෞඛ්‍යය නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් කරුණක් හේතු කොට ගෙන හෝ සාමාජිකයකුට තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(7) මේ කොටස යටතේ තම කාර්ය කරගෙන යාමේ දී, උපදේශක කොමිෂන් සභාවට සහාය වීම පිණිස, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, උපදේශක කොමිෂන් සභාව විසින් නිලධරයන් සහ සේවක යන් පත් කළ හැකි ය.

(8) උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයන්ට, එහි ලේකම් වරයාට සහ අනිකුත් නිලධරයන්ට සහ සේවකයන්ට පාර්ලිමේන්තුව විසින් එම කාර්ය සඳහා වෙන් කරන ලද මුදලින්, අමාත්‍ය වරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමික මුදලක් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ගෙවනු ලැබිය හැකි ය.

45. මේ පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,— අර්ථ නිරූපණය

"උචිත දිසා අධිකරණය" යන්නෙන්, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටියේ යම් දිසා අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද ඒ දිසා අධිකරණය අදහස් වේ;

"ව්‍යාපාරය" යන්නට යම් වෙළෙඳාමක් හෝ වෘත්තියක් ඇතුළත් වේ;

"ව්‍යාපාර නාමය" යන්නෙන් හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ අන්‍යාකාරයෙන් යම් ව්‍යාපාරයක් කර ගෙන යනු ලබන්නේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ ද ඒ නාමය හෝ අභිධානය අදහස් වන අතර, විලාසමක් ද ඊට ඇතුළත් වේ;

"සංස්ථාව" යන්නෙන්, යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ පිහිටුවන ලද සංස්ථාවක් අදහස් වන අතර, සමාගම්වලට අදාළ නීතියෙහි අර්ථ කථනය කරනු ලැබ ඇති සමාගමක් ද ඊට ඇතුළත් වේ;

"අධ්‍යක්ෂවරයා" හා "ලේකම්වරයා" යන්නට, කවර හෝ නමකින් හඳුන්වනු ලබන, අධ්‍යක්ෂවරයාගේ හෝ ලේකම්වරයාගේ තත්ත්වය දරන යම් තැනැත්තකු ඇතුළත් වේ;

"ව්‍යාපාර ආයතනය" යන්නෙන්, ලාභය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ අරමුණ ඇතිව එකිනෙකා සමග හවුල් ව්‍යාපාරයක් වශයෙන් බැඳුණු පුද්ගලයන් දෙදෙනකු ගෙන් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් හෝ පුද්ගලයන් එක් කෙනකුගෙන් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් හා සංස්ථා එකකින් හෝ ඊට වැඩි ගණනකින් හෝ සංස්ථා දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් අදහස් වේ;

"සම්පූර්ණ නාමය" යන්නට පෙළපත් නාමයක් හෝ වෙනත් අවසන් නාමයක් සම්පූර්ණයෙන් යෙදී ඇති සහ මුලින් එන නම් සම්පූර්ණ වශයෙන් හෝ ඒ ඒ නම්වල මුල් අකුරු වලින් යෙදී ඇති අවස්ථාවක් ඇතුළත් වේ;

"පුද්ගලයා" යන්නෙන් ස්වභාවික තැනැත්තකු අදහස් වන අතර, සංස්ථාවක් ඊට ඇතුළත් නොවේ;

"තැනැත්තා" යන්නට සංස්ථාවක් ඇතුළත් වේ;

"නියමිත" යන්නෙන් මෙම පනත ප්‍රකාර සාදන ලද නියෝග මගින් නියමිත වූ යන්න අදහස් වේ;

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා අදහස් වන අතර, අතිරේක රෙජිස්ට්‍රාර්වරයකු සහ සහකාර රෙජිස්ට්‍රාර්වරයකු හෝ එවැනි යම් තත්ත්වයකින් ක්‍රියා කරන යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ.

ඉවත් කිරීම හා අත් හැරීම

46. (1) (149 වන අධිකාරය වූ) ව්‍යාපාර නාම ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී ආඥාපනත ඉවත් කරනු ලැබුව ද—

(අ) එහි 9 වන වගන්තියේ අර්ථානුකූලව පැහැර හැරීම් කළ තැනැත්තන් කෙරෙහි පනවන ලද අශක්තතාවට තවදුරටත් ඔවුන් යටත් විය යුතු අතර, ඒ වගන්තියෙන් විධිවිධාන සලසා ඇති සහනය ලැබීමේ අයිතියට ද යටත් වන්නේ ය;

(ආ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ නිකුත් කරන ලද සියලු ලියාපදිංචි කිරීමේ සහතික, මේ පනතේ විධිවිධාන යටතේ අලුත් ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කරන තෙක්, අඛණ්ඩ ලෙස වලංගුව හා ක්‍රියාත්මකව පැවතිය යුතු ය;

(ඇ) ඒ යටතේ සාදන ලදුව නියමිත දින සිට බලාත්මකව පවත්නා හැම රීතියක් ම හෝ කරන ලද නියමයක් ම, මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන තාක් දුරට ඒ රීතිය හෝ නියමය මේ පනත යටතේ සාදන ලද නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය;

(ඈ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ සැපයීමට අවශ්‍ය විස්තර අඩංගු ලියවිල්ලකින් වූ සෑම ප්‍රකාශයක් ම හෝ ඉවත් කරන ලද ආඥාපනත යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත දිනයට පෙරාතුව ඉදිරිපත් කරන ලද විස්තරවල යම් වෙනස්වීමක් පිළිබඳ සෑම ප්‍රකාශයක්ම වලංගු සහ බලසහිත විය යුතු අතර, විස්තර සැපයීම, විස්තරවල වෙනස්වීම්, නියමිත ගාස්තු ගෙවීම, ලියාපදිංචි කිරීම සහ සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් අදාළ මේ පනතේ විධිවිධාන ඒ අනුව එකී සෑම ප්‍රකාශයකටම අදාළ විය යුතු ය ;

(ඉ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ තබා ඇති යම් වාර්තා ලේඛනයක්, සූචියක් හෝ ලියවිල්ලක්, මේ පනත යටතේ තබන ලද වාර්තා ලේඛනයක්, සූචියක් හෝ ලියවිල්ලක් ලෙස සහ ඒවායේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඊ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ යම් අධිකරණයක නියමිත දිනයට පෙරාතුව වූ දිනයක විනිශ්චයට භාජනව පවත්නා සියලු නීති කෘත්‍ය, ඉවත් කරන ලද ආඥාපනතේ විධිවිධාන යටතේ විභාග කළ යුතු අතර, ඒ යටතේ අර්ථ නිරූපණය කළ යුතු ය.